# ප්‍රේමකුමාර් ගුනරත්නම්

## සැගවී ඉන්නේ ඇයි?

ජවිපෙ කැරැලිකාර කණ්ඩායමේ සැගවුණු නායක ප්‍රේමකුමාර් ගුනරත්නම්ගේ බිරිඳ වන ඔස්ට්‍රේලියාවේ පදිංචි චම්පා සෝමරත්න නිවා-ඩුවකට පැමිණ රටින් පිටව යද්දී ගුවන් තොටුපළේදී ප්‍රශ්න කිරීමට භාජනය වීම පුවත්පත්වල වාර්තා විය.

ගුනරත්නම් කොටි සංවිධානයේ කේ.පී. වැනි ජාත්‍යන්තර ත්‍රස්ත නායකයෙක් නො වේ. ඔහු කර ඇති වරද ලෙස පෙනෙන්නේ ව්‍යාජ හැඳුනුම්පත් හා ගමන් පලපත්‍ර භාවිතා කිරීමයි. එහෙත්, ඒවා ව්‍යාජ ද යන්න ද පැහැදිලි නැත. මිනිසකුට සිය නම වෙනස් කර ගැනීමට හිමිකමක් ඇත.

සාමාන්‍ය මධ්‍යම පංතික සිහින සහිත පවුලක් හිමි මේ පුද්ගලයා අනවශ්‍ය ලෙස සැගවී සිටින්නේ මන් ද?

ඔහු පිළිබඳ තොරතුරු බුද්ධි අංශවලට දුන්නේ ඔහු රහසිගත ජීවිතයකට තල්ලු කළ අය විසින් ම බවට චෝදනා ඇත.

ජවිපෙ මෙවැනි රහසිගත නායකයන් පවත්වාගෙන ගියේ පක්ෂය වෙනුවෙන් සිය දිවි කපා කර සිටි පහළ සාමාජිකයන් තුළ සමා-ජවාදය පිළිබඳ බලාපොරොත්තුව හා විශ්වාසය පවත්වාගෙන යන්නට ය. අද දවසේ ධනේශ්වර දේශපාලනය සමග සන්ධානගතව නායකයන් විවිධ වැරදි දේශපාලන ක්‍රියාකාරිත්වයන්හි යෙදී සිටියත් පක්ෂයේ සමාජවාදය කෙරෙහි රැකැපවීම නො නැසී ඇති බව සාමාජිකයන්ට මාකට් කළේ ප්‍රේමකුමාර් ගුනරත්නම් වැනි අය විසිනි.

නායකයන්ට සිය උන්නතිකාමී සිහින පසුපස හඹා යාම පිණිස හෝ පක්ෂය විසින් අත්පත් කර දුන් සමාජ ප්‍රාග්ධනය රැස් කර ගැනීමට සාමාජික ශ්‍රමය මිරිකා ගත හැකි වුණේ ඒ ඔස්සේ ය.

ප්‍රේමකුමාර් ගුනරත්නම් ද කලෙක මෙම කුමන්ත්‍රණයේ හවුල්කරු-වකු වන්නට ඇත. ඔහුට 1989 කැරැලි සමයේ ක්‍රියාකාරිකයන්ව සිටි සෙසු ජවිපෙ සාමාජිකයන්ට නො තිබුණු අත්දමේ සුවිශේෂ ආරක්ෂක ගැටලුවක් තිබුණා නම් ජවිපෙ ආණ්ඩුව සමග සන්ධානගතව සිටි සමයේ පහසුවෙන් සිය නෛතික පැවැත්ම තහවුරු කර ගන්නට ඔහුට හැකියාව තිබිණි.

සෝමවංශ අමරසිංහට රටින් පැන ගන්නට උදව් කළ පුද්ගලයන් සිර දඬුවම් වින්දත් සෝමවංශ ආපසු පැමිණීමෙන් පසු එවැනි කිසිදු දුෂ්කරතාවකට මුහුණ දුන්නේ නැත. විමලසිරි ගම්ලත් ලෙස ප්‍රසිද්ධ වී සිටි විමල් වීරවංශ වහා සිය සැබෑ නම භාවිතා කිරීමට පටන් ගත්තේ ය.

දරුවන් ප්‍රභූ පාසල්වලට ඇතුළත් කිරීම, පවුල සමග දියුණු ධනේශ්වර රටක් වන ඔස්ට්‍රේලියාවට සංක්‍රමණය වීම වැනි කාරණාවලදී ගුනරත්නම් උපයෝගී කර ගත් ඒ සබඳතා සිය පැවැත්ම නීත්‍යානුකූල කර ගන්නට යොදා ගන්නට බැරි වන්නට කිසිදු හේතුවක් නැත. ඒ වෙනුවට හේ තමන් රහසිගත නායකයකු ලෙස සාමාජිකයන්ට මාකට් වීම තෝරා ගත්තේ ය.

ඒ ගුනරත්නම්ව ම දැන් ප්‍රධාන ධාරාවේ ජවිපෙ විසින් පාවා දී ඇත. ඔවුන්ගේ පාවා දීම් නිසා අපහසුවට පත් වී සිටින ගුනරත්නම්ගේ බිරිඳ හා දරුවන් වනාහි අද ජවිපෙ නායකයන් විසින් කලක් ළඟින් අසුරු කළ අයයි. අවසානයේදී උන්නතිකාමී සාමාන්‍ය මධ්‍යම පංතික පවුලකට අයත් දුරු රටක වෙසෙන දරුවන් දෙදෙනෙකුට සිය ආදරයය පියාගේ ඇසුර අවශ්‍ය ම කාලයක අහිමි වී ඇත.

ජවිපෙ වැනි පෙරටුගාමී පක්ෂවල දැලට හසු වන මිනිසුන්ට තමන් කලක් සහෝදරයන් ලෙස සැලකූ අයගෙන් මෙවැනි අදහා ගත නො හැකි අමානුෂික තෑගි ලැබෙන බව තේරුම් යන්නේ පක්ෂයෙන් දොට්ට බැස්ස දාට ය.

ජන අරගල ව්‍යාපාරයට තවත් පෙරටුගාමී පක්ෂයක් නො හඳන්නටත්, මනුෂ්‍යත්වයේ දේශපාලනය යළි සොයා යන්නටත්, ප්‍රේමතුමාර් ගුනරත්නම්ට තවත් හැංගිමුත්තන් සෙල්ලමක් පටන් නො ගන්නටත්, මේ අත්දැකීම් හේතු වේවා යි අපි පතමු.

http://w3lanka.blogspot.com/2012/01/blog-post_4960.html

# ජනතා විමුක්ති පෙරමුණට විකල්පය කුමක් ද?

අජිත් පැරකුම් ජයසිංහ

"දවසක් නෝනයි මමයි කතා කර කර ඉන්න-කොට මෙ කිව්වා මට මහණ වෙන්න ඕනා කියලා. එයාත් කැමැති වුණා. මම හැම දෙයකින්ම නිදහස් වුණාට එක රහසක් මගේ හිතේ රඳුම් දුන්නා. ඒ තමයි රෝහණ විජේවීර සහෝදරයාගේ මිනී අළු මුට්ටිය සගවපු තැන එතකොට දන්නේ මම විතරයි. ඉතිං ඒ රහසත් අරගෙන මගේ හිත නිදහස් කර ගන්න යන්න බැහැනේ. පස්සේ මම ආරණ්‍යයට යන්න දින කිහිපයකට පෙර බත්තරමුල්ලේ ජවිපෙ ප්‍රධාන කාර්යාලයට ගිහින් කිව්වා රෝහණ විජේවීර සහෝදරයාගේ මිනී අළු මුට්ටිය තියෙන තැන දන්නේ මම විතරයි. මම තමයි ඒ අළු ටික සුරක්ෂිතව සගවලා තිබ්බේ ඔයාලා කැමතිද ඒක දැනගන්න කියලා.

"කොච්චර දෙයක්ද මෙත්තයා. අළු ටිකවත් තියෙනවා නම්. අපි හිතුවේ ඒ ටිකත් නැතුව ඇති කියලා. මටත් ස්තූති කරලා ඒ සහෝදරවරු මගෙන් ඒ සම්බන්ධව විස්රිතරත් ඇහුවා. මම කිසිවක් නොසගවා හැම දේම ඒ අයට කිව්වා. මිනී අළු ගන්න උසාවි තියෙ-



ාගයක් ඕනෑ නැහැ. හමුත් විජේවීර සහෝ-ාදරයාගේ මිනී අළු ටික ගන්න උසාවි තියෙ-ාගයක් ඕනා. උසාවි තියෝගයක් ගන්න ආකා-රයත් මම ඒ අයට පැහැදිලි කර දුන්නා. බොරුල්ල කනත්තට ඒ අයට එන්න කියලා විජේවීර සහෝදරයාගේ අළු මුට්ටිය වළ දාලා තියෙන තැනත් මම පෙන්නුවා. මේ සිද්ධිය වෙලා දැන් අවුරුදු ගාණක් වෙනවා. නමුත් මම දන්න විදිහට ඒ අළු මුට්ටිය ගන්න ජවිපෙ වර්තමාන සහෝදරවරු කිසිම කෙනෙක් බොරුල්ල කනත්තට ගිහිල්ලා නැහැ. විජේවීර

*<u>එසේ නෙරපා හරිනු ලැබුවේ ද්‍රෝහීන්ව ය. දින කිහිපයකට පෙර මේ ද්‍රෝහීහු සහෝදරයෝ වූ හ. ඔවුන් නෙරපා හරිනු ලබන්නේ ඇත්තෙන් ම, ඔවුන් ඝාතනය කිරීම සඳහා බලය නැති නිසා ය. නැතිනම් කරන්නේ මරා දැමීම ය.</u>*

සහෝ දරයාගේ හෞමවාශේෂ ටික තවමත් සුරක්ෂිතව තියෙන බව තමයි මට නම් දැනගන්න තියෙන්නේ. මට හිතෙන විදිහට රෝහණ විජේවීර සහෝදරයාගේ මිනී අළුවලින් වර්තමාන ජවිපෙ නායකයන්ට වැඩක් නැතිව ඇති. මේ මම කියන දේ කාටත් පොදුයි. අද්දැකීමෙන් කියන්නේ. කෙනෙක් මැරුණාහම කවුරු කොහොම දුක් වුණත් ඒ මොහොතකට හෝ දින කිහිපයකට පමණයි. නැතුව පණපිටින් ඉන්න අය හැමදාම මැරිච්ච අය ගැන හිතන්නේ නැහැ."

දිවයින පුවත්පතට මෙසේ පවසන්නේ කලක් බොරුල්ල කනත්ත භාරකරුව සිට පසුව පැවදි වී සිටින ඇතුල්කෝරිටේ සාරානන්ද හිමි ය.

එහිමියන්ගේ ප්‍රකාශයෙන් ජවිපෙ වැනි පෙරටුගාමී පක්ෂවල එක් ලක්ෂණයක් කදිමට නිරූපණය කෙරේ. ඒ වනාහි මිනිස් ජීවිත කෙරෙහි ගරුත්වයක්, ආදරයක් නැතිකමයි.

ජවිපෙ විශේෂ සමුළුවක් දෙබරවැවදි පැවැත්විණි. එහි මූලික අරමුණ වූයේ පක්ෂයේ සාමාජිකත්වයෙන් විශාල පිරිසක් නෙරපා හැරීමයි. එසේ නෙරපා හරිනු ලැබුවේ ද්‍රෝහීන්ව ය. දින කිහිපයකට පෙර මේ ද්‍රෝහීහු සහෝදරයෝ වූ හ.

ඔවුන් නෙරපා හරිනු ලබන්නේ ඇත්තෙන් ම, ඔවුන් ඝාතනය කිරීම සඳහා බලය නැති නිසා ය. නැතිනම් කරන්නේ මරා දැමීම ය.

පක්ෂය වෙනුවෙන් ජීවිත පරිත්‍යාගයෙන් වැඩ කළ, එහෙත්, මතවාදී හෝ වෙනත් හේතුවක් මත පක්ෂයෙන් ඉවත් වූ මිනිසුන්ගේ ජීවිත හා ඔවුන් පක්ෂය වෙනුවෙන් කළ කැප කිරීම්වලට ගැන ඇති අගයීම කුමක් ද?

"ඒව එහෙම තමයි. කරන්න දෙයක් නැහැ. පක්ෂය වෙනුවෙන් අපි මේ දේ කළ යුතුයි. වැදගත් ම දේ පක්ෂය."

පක්ෂය ඇත්තේ ජනතාවගේ විමුක්තිය වෙනුවෙන් යයි කියනු ලැබේ. එවිට මෙම පක්ෂ සාමාජිකයෝ කවරහු ද? ඔවුහු ජනතාව නො වෙති ද? පක්ෂය ජනතාව වෙත දිගු කරන බව කියන දයාවේ අයෝමය හස්තයේ රෝම කූපයක පහස හෝ ඔවුන්ට නැද්ද?

මෙවැනි ස්ටාලින්වාදී පක්ෂවල පැරණි නායකයන් වැඩි දෙනෙක් එයින් ජීවනෝපාය, කීර්තිය හා ලිංගික ආස්වාදය ලබා ගන්නා අවස්ථාවාදීහු ය. ඔවුන් වැඩි දෙනෙක් පක්ෂ දේශපාලනය හරහා මේ වන විට අත්පත් කරගෙන තිබෙන තත්වය වැනි තත්වයක් සාමාන්‍ය ජීවිතයකදී නම් කිසි සේත් ම ලබා ගත නො හැකි තරමේ සාමාන්‍ය පුද්ගලයෝ ය. ඔවුහු කිසිදු ක්ෂේත්‍රයක කැපී පෙනෙන දක්ෂතාවක් දක්වන්නෝ නො වෙති. තමන් අත්පත් කර ගත් තත්වය රැක ගැනීම ඔවුන්ගේ මූලික අරමුණයි.

නායකත්වය ප්‍රශ්න නො කළ යුතු දෙයක් ය යන මතය ද, නායකයන් කුමන තත්වයකට පත් වුවත් තමන්ගේ වැඩ කොටස නො පිරිහෙළා ඉටු කිරීම සාමාජිකයන්ගේ වගකීම බව ද, වැදගත් වන්නේ පුද්ගලයන් නො ව පක්ෂය බව ද සාමාජිකයන් අතර ප්‍රවර්ධනය කරනු ලැබේ.

ඉතින් මෙම පක්ෂවල මුළු ජීවිත කාලය පුරා ම තාප්පවල පාප්ප ගාන කෙසග සිරුරුය ඇති පීඩිතයෝ බහුල ය. ඔවුහු කිසිදු කලෙක පක්ෂ ධුරාවලි හිඟිපෙනේ අඩියක්වත් ඉහළ නො යති. ඔය අස්සේ රාජකීය, ආනන්ද වැනි පාසලකට ගිය එකෙක්, දොස්තරෙක් වැනි මධ්‍යම පංතිකයෙක් පක්ෂයට සෙට් වුණොත් උන් ඩබල් ටිබල් ප්‍රමෝෂන් ගසමින් නයි, ඉනිමං පෙනක ඉනිමගක් හමු වූ ඉන්තකු සේ ඉහළ යති. එසේ වන්නට හේතුව මෙම පක්ෂවල සිටින ක්‍රම විරෝධීන් යයි කියා ගන්නා වැඩි දෙනෙක් එවැනි වූ තමන්ට අත්පත් කර ගත නො හැකි සිහින වන්දනා රාජ්‍යයක් ගොඩනැගීමේ කොන්ත්‍රාත්තුවක් තමන් විසින් තමන්ට දී ගත් පිරිසක් වීමයි. මොවුහු මූලික වශයෙන් ම කම්කරුවෝ නො වෙති. කම්කරු පංතියේ විමුක්තිදායකයන් ලෙස තමන් විසින් තමන් ම පත් කර ගත් පිරිසකි.

කම්කරුවන්ට විමුක්තිය ලබා දීමට වෙනත් අය අවශ්‍ය නැත. කම්කරුවන්ට තමන්ගේ විමුක්තිය ලබා ගැනීම සඳහා තමන් ම සංවිධානය වීමේ හැකියාව තිබේ.

ධනපති පංතිය විසින් කරන ශ්‍රම සූරාකෑමට එරෙහිව සටන් කරන පක්ෂයක් මුලින් ම තමන් තුළ ඇති කර ගත යුතු තත්වයක් වන්නේ ශ්‍රමය ඇගයීමයි. සාමාජිකයා පක්ෂය වෙනුවෙන් කැප කරන ශ්‍රමයට ඇගයීමක් තිබිය යුතු ය.

පෙරටුගාමී පක්ෂයට විකල්පය කම්කරු පංතිය ප්‍රජාතන්ත්‍රවාදයෙන් ශක්තිමත් කිරීමයි.

කළ යුතු දෙය දන්නාඩ බව කියන අතළොස්සක් සියල්ල දත් ශාස්තෘන් වන්දනා මාන කරන පෙරටුගාමී පක්ෂ වෙනුවට කළ යුතු දෙය පිළිබඳ සංවාදයක් කරන විවෘත මනසින් යුත් වැඩ කරන පංතියක් බිහි කිරීම වෙනුවෙන් වාමාංශිකයන් ක්‍රියාත්මක විය යුතු ය.

පෙරටුගාමී පක්ෂ සංකල්පය මතවාදීමය වශයෙන් පැරදවීම අද දවසේ වම හමුවේ ඇති ප්‍රධාන ම අභියෝගයයි.

http://w3lanka.blogspot.com/2012/01/blog-post_02.html

## සුබස් සිතිවිලි



වි ක ධර්මබන්ධු

නොවැළැක්විය හැකි හේතු මත මෙම ලිපිය මෙවර පළ නොවන බව කරුණාවෙන් සළකන්න